| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි)<br>All Rights Reserved) | **මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2017**<br>Primary Piriven Mid Term Test - 2017<br>03 වසර /Grade 03<br>**පාලි** කාලය : පැය තුන යි<br>**PALI** Time : Three Hours |

**I** කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද, **II** කොටසින් 02, 03 ප්‍රශ්න ද ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහකට (05) **පමණක්** පිළිතුරු සපයන්න.

---

**I කොටස**

01. කෙටි පිළිතුරු සපයන්න.

i. **ද්වන්ද, කම්මධාරය, බහුබ්බීහි** හා **දිගු** යන සමාස සඳහා නිදසුන බැගින් ලියා දක්වන්න.
ii. **පුච්ඡ, මුච්ඡ, පුඤ්ඡ, උඤ්ඡ** යන ධාතු යෙදෙන අර්ථ කච්චායන ධාතුමඤ්ජුසාවට අනුව ලියා දක්වන්න.
iii. සමාස ප්‍රභේද 04ක් ලියා දක්වන්න.
iv. 'අථො + අපි > අථො'පි ' යන්නෙහි සන්ධි රීතීන් ලියන්න.
v. **රුක්ඛං, දසබලො, සාමණෙරො, දුතියො** යන පදවල ව්‍යාකරණ අංගය ලියන්න.
vi. කවීහු හතර දෙනෙකි. නම් කරන්න.
vii. රසවාහිනියෙහි අන්තර්ගත කථාවස්තු 4ක නම් ලියා දක්වන්න.
viii. **අංග අටකින්, දස වසකින්, උපුල්මල් දාහතකින්, සදෙව් ලොවෙහි** යන වචන සමාස කර පාලියෙන් ලියා දක්වන්න.
ix. නාගසේන තෙරුන් හා ධර්මය පිළිබඳ නිතර තර්ක කළ රජතුමා කවුද?
x. ආඛ්‍යාත විභක්ති 08 ලියා දක්වන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

**II කොටස**

02. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

තතො දූතො තං ලෙඛං දෙවියා පෙක්ඛමානාය භූමියං පාතෙසි. රාජා තස්ස සද්දං සුත්වා නිවත්තිත්වා ඔලොකෙත්වා ථෙරස්ස ලෙඛනසමානං ලෙඛං දිස්වා නිස්සංසයං ථෙරෙන කතකම්මන්ති මඤ්ඤමානො කුජ්ඣිත්වා එතං තෙලකටාහෙ ඛිපථාති ආණාපෙසි.

*(ලකුණු 05 යි)*

(ආ) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. මිගා ගුහං පවිසන්ති.
ii. රාජා ධම්මිකො භවති.
iii. ද්වෙ ඵලානි රුක්ඛතො පතන්ති.
iv. පුන තෙපි භගවන්තං එතදවොචුං.
v. සො සුඛෙන පුප්ඵරාසිං උපගච්ඡති.

*(ලකුණු 05 යි)*

(ඉ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. මිනිස්සු සුවෙන් වසත්.
ii. ඒ උපාසකයා අවුරුද්දක් දන් දෙයි.
iii. ඔහු උදෑසන ම නැගිට්ටේ ය.
iv. දෙකකින් කර්මාන්ත කරවන්න.
v. මම මනා ව ඉගෙන ගනිමි.

*(ලකුණු 05 යි)*

03. (අ) පහත සඳහන් ඡේදය සිංහලයට නගන්න.

භික්ඛු අච්ඡරියම්භන්තෙ අබ්භුතං තයා කතං ඊදිසෙන ඝොරාසිවිසෙන සප්පෙන දට්ඨෙනාපි විසවෙගෙන අනජ්ඣොත්ථරිතෙන හුත්වා ධම්මං සුණමානෙනාති ආහංසු. තතො සො ආවුසො විසං මෙ සාවසෙසං තං සච්චකිරියානුභාවෙන හනිස්සාමීති. සච්චකිරියං කරොන්තො එවමාහ.

*(ලකුණු 08 යි)*

(ආ) ධර්මශ්‍රවණයේ ආනිසංස ඔබ දන්නා රසවාහිනි කථාවක් ඇසුරින් පෙන්වා දෙන්න.

*(ලකුණු 07 යි)*

04. (අ) සන්ධි ප්‍රභේද තුන නම් කර උදාහරණ තුනක් ලියන්න.

*(ලකුණු 05 යි)*

(ආ) සමාස ප්‍රභේද 6 නම් කොට උදාහරණය බැගින් ලියන්න.

*(ලකුණු 05 යි)*

(ඉ) තද්ධිත පදයක් සාදාගන්නා ආකාරය නිදසුන් මගින් පෙන්වා දෙන්න.

*(ලකුණු 05 යි)*

05. (අ) පද කොටස් තුනකි. එම කොටස් තුන ලියා දක්වන්න.

(ආ) නාමපද යනු මොනවාදැයි හඳුන්වා නාමපදයක් සෑදෙන ආකාරය පෙන්වා දෙන්න.

(ඉ) ''එක'' ශබ්දය හෝ ''ති'' ශබ්දය ලිංගත්‍රයේ සියලු විභක්තිවල වර නගා වගු ගත කර දක්වන්න.

*(ලකුණු 03 + 06 + 06 = 15 යි)*

06. (අ) ආඛ්‍යාත විභක්ති තුනක් නම් කරන්න.

(ආ) නිදසුන් මගින් ආඛ්‍යාත පදයක් සාදාගන්නා ආකාරය පෙන්වා දෙන්න.

(ඉ) √**කර** ධාතුව හෝ √වද ධාතුව හෝ පඤ්චමී ආඛ්‍යාත උභය පදයේ වරනගන්න.

*(ලකුණු 03 + 06 + 06 = 15 යි)*

07. (අ) පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.

i. අචිරං වතයං කායො .....

ii. න පරෙසං විලොමානි ......

iii. චරන්ති බාලා දුම්මෙධා ......

*(ලකුණු 03 × 03 = 09 යි)*

(ආ) ඉහත ගාථාවලින් එක් ගාථාවක අදහස ලියා දක්වන්න.

*(ලකුණු 06 යි)*

***